දුරකථනය
தொலைபேசி
Telephon } 011-2478373
011-2573429
email dcoopdev@sltnet.lk
Web www.coop.gov.lk

ෆැක්ස්
பெக்ஸ்
Fax } 011-2478386

විදුලි පණිවුඩ
தந்திகூட்டுறவானை
TelegramsCREDIT }


මගේඅංකය
எனது
My No } DCD/5/1/8/CIR

ඔබේඅංකය
உமது எண்
Your No }

සමුපකාරම දිනය
திகதி
Date } 2014.07. 17


# සමුපකාරසංවර්ධන දෙපාර්තමේන්තුව

තැ.පෙ. 419, නො: 330, යුනියන් පෙදෙස, කොළඹ-02

கூட்டுறவுஅபிவிருத்தித் திணைக்களம்
DEVELOPMENT
த.பெ. 419, இல330,
யுனியன் ப்ளேஸ்,கொழும்பு– 02

DEPARTMENT OF CO-OPERATIVE

P.O.Box 419, No – 330,
Union Place, Colombo - 02


**දෙපාර්තමේන්තු චක්‍ර ලේඛ: 01/2014**

සියළුම මූල්‍ය සේවා සමුපකාර සමිති සහ
සංගම්වල ගරු සභාපතිවරුන් වෙත.

## අක්‍රීය ණය වර්ගීකරණය හා බොල්ණය සඳහා ප්‍රතිපාදනය

මෙම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ බැංකු සහ මූල්‍ය සේවා කටයුතු සිදුකරනු ලබන සියළුම සමුපකාර සමිති හා සංගම්වල අක්‍රීය ණය හඳුනා ගැනීම , වර්ගීකරණය , බොල් /අඩමාණ ණය සඳහා වෙන් කිරීම් කටයුතුවල ඒකීය හා විධිමත්භාවය අරමුණු කොට ගෙන මෙම චක්‍රලේඛනය නිකුත් කෙරේ.

02.සාමාජික හා සාමාජික නොවන ආකාරයෙන් රැස්කරනු ලබන තැන්පත් , ණය හෝ වෙනත් ආකාරයකින් රැස්කරනු ලබන මුදල් සාමාජික ණය සම්පාදනයට යොදා ගැනීමේ දී ණය කළඹේ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම තුලින් තැන්පත් නැවත ගෙවීමේ හැකියාව සුරක්ෂිත වනු ඇත. ඒ අනුව ණය කළඹේ ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා මෙම චක්‍රලේඛනය මඟින් ලබා දී ඇති උපදෙස් අනුගමනය කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරමි.

03. ඒ අනුව සෑම මූල්‍ය සේවා සමුපකාර සමිතියක්/සංගමයක් විසින්ම ණය කළමණාකරණයන් හිදී පහත සඳහන් පරිදි අක්‍රීය ණය වර්ගීකරණය හා බොල්ණය සඳහා ප්‍රතිපාදනයන් සිදු කල යුතු බව මෙයින් අවධාරණය කරමි.

**(අ). අක්‍රීය ණය ලෙස සලකනු ලබන්නේ පහත සඳහන් පරිදි ආපසු ගෙවීම් හිඟ හිට ඇති ණය මුදල් වේ.**

01.මාසිකව වාරික ගෙවිය යුතු ණය මුදලක් නම් මුල් මුදල සහ/හෝ පොලිය නොකඩවා වාරික තුනක් නොගෙවා තිබෙන විට එම නොපියවූ මුළු මුදල .

02. කාර්තු වශයෙන් හෝ අර්ධ වාර්ෂික වශයෙන් ගෙවිය යුතු ණය මුදලක් නම් වාරිකය ගෙවිය යුතු දින සිට දින 90 ක් ඇතුලත නොගෙවා තිබෙන විට එම නොපියවූ මුළු මුදල.

03. එකවර ආපසු ගෙවිය යුතු ණය මුදලක් නම් ණය මුදල ගෙවිය යුතු දින සිට දින 90 ක් ඇතුලත නොගෙවා තිබෙන විට එම නොපියවූ සම්පූර්ණ ණය මුදල.

04. අක්‍රීය ණය මුදලක් බවට පත් වීමට පෙර ප්‍රතිලේඛන ගත කරන ලද ණය මුදලක් නම් ප්‍රතිලේඛන ගත කිරීමට පෙර සහ පසු කාලය එකතු කළ විට දින 90 ක් ඇතුලත නොගෙවා තිබෙන විට එම නොපියවූ සම්පූර්ණ ණය මුදල

**(ආ). අක්‍රීය ණය සඳහා බොල් ණය ප්‍රතිපාදනය**

සෑම සමුපකාර මූල්‍ය ආයතනයක්ම ආදායම් ප්‍රකාශය පිළියෙල කරන අවස්ථාවේදී අක්‍රීය ණය වෙනුවෙන් බොල් ණය ප්‍රතිපාදනය කල යුතුය.

බොල් ණය වෙන් කිරීමේ පදනම විය යුත්තේ පහත දැක්වෙන 1 වැනි තීරුවේ සඳහන් වර්ගීකරණයයි. එම වර්ගීකරණයට අදාල බොල්ණය ප්‍රතිපාදනය කිරීමේ ප්‍රතිශතය කුමක්ද යන්න 2 වැනි තීරුවේ දැක්වේ.

| 1වැනි තීරුව | 2වැනි තීරුව |
|---|---|
| අක්‍රීය ණය වර්ගීකරණය | බොල්ණය වෙන් කිරීමේ ප්‍රතිශතය |
| 1. <u>කල් ඉකුත්වූ අක්‍රීය ණය (overdue)</u> : එනම් මාස 3 කට වැඩි එහෙත් මාස 6 කට නොවැඩි කාලයක් නොගෙවා තිබෙන ණය | - |
| **2. <u>අව ප්‍රමාණ ණය (substandard) :</u>** එනම් මාස 6 කට වැඩි එහෙත් මාස 12 කට නොවැඩි කාලයක් නොගෙවා තිබෙන ණය | 20% |
| **3. <u>අඩමාන ණය (doubtful) :</u>** එනම් මාස 12 කට වැඩි එහෙත් මාස18 කට නොවැඩි කාලයක් නොගෙවා තිබෙන ණය | 50% |
| **4. <u>බොල් ණය (loss) :</u>** මාස 18 කට වැඩි කාලයක් නොගෙවා තිබෙන ණය | 100% |

මෙහි දක්වා ඇත්තේ අවම වශයෙන් තිබිය යුතු බොල්ණය ප්‍රතිපාදන වේ. මීට වැඩිමනත්ව මුළු ණය ප්‍රමාණය මත යම් සාමාන්‍ය ප්‍රතිපාදනයක් සිදුකිරීම සඳහා කළමනාකරණයේ අවධානය යොමුවිය යුතුය.

**(ඇ). බොල්ණය ප්‍රතිපාදනයේදී සුරකුම් සැලකිල්ලට ගැනීම.**

අදාළ බොල්ණය ප්‍රමාණය තීරණය කිරීමේදී පහත දැක්වෙන පරිදි වත්කම්වල අගය එම බොල්ණය ප්‍රතිපාදන ප්‍රමාණයෙන් අඩුකර ඉතිරි ශේෂය පමණක් ආදායම් ප්‍රකාශයේ සටහන් කිරීමට සමුපකාර සමිතියට අවකාශ ලැබේ.

1. ණය මුදල් ප්‍රදානය කිරීමේදී බලපත්‍ර ලාභී වාණිජ බැංකුවක හෝ විශේෂිත බැංකුවක තැන්පතු සුරකුම් වශයෙන් ලබාගෙන ඇත්නම් හා එම තැන්පතු සියළු බැදීම් වලින් තොර නම් එබඳු තැන්පතුවල මුළු වටිනාකම

2. තම සමුපකාර සමිතියේම ස්ථාවර තැන්පතුවක් හෝ ඉතුරුම් ගිණුම් ශේෂයක් සුරකුම් වශයෙන් තබා ඇති අවස්ථාවලදී හා ණය මුදල පියවීම සඳහා එම තැන්පතු යොදා ගැනීමට බලය දී ඇති විටදී එම තැන්පතුවල මුළු අගය

3. උකස් අත්තිකාරමක් නම් රත්‍රංවල වෙළඳපොළ වටිනාකම

4. ඉඩම් හා ගොඩනැගිලි සුරකුම් වශයෙන් ලබාගෙන ඇති අවස්ථාවලදී අදාල වත්කමෙහි වෙළඳපොළ අගය සුදුසුකම් ලත් වෘත්තිමය තක්සේරු කරුවකුගේ අගයකිරීමක් මත හෝ අදාල රජයේ දෙපාර්තමේන්තුවක අගය කිරීමක් මත පදනම් විය යුතුය. කෙසේ වුවද සාපේක්ෂ වශයෙන් අඩු වටිනාකමක් ඇති දේපල සම්බන්ධයෙන් සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය/කාරක සභාව විසින් පත් කරන ලද කමිටුවක් මගින් දේපලෙහි වටිනාකම තක්සේරු කළ හැකිය. මෙම කමිටුවට බැංකු සේවා කළමණාකාරු, සමිතියේ ගණකාධිකාරී සහ සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයාගේ නියෝජිතයෙකු ද ඇතුලත් විය යුතුය.මෙහිදී විශේෂයෙන්ම අදාල සුරකුමෙහි නීත්‍යානුකුල අයිතිය තහවුරු වී තිබිය යුතු අතර එසේ නොවන අවස්ථා වලදී එකී සුරකුම් මේ සඳහා අදාල කර නොගත යුතුය.

5 . මෙසේ ලබාගත් දේපල තක්සේරු අගය පහත සඳහන් පරිදි බොල් ණය ප්‍රතිපාදනයෙන් අඩු කිරීමට අවකාශ ලැබේ.

| ණය මුදල නොගෙවා තිබෙන කාලය | දේපල සුරකුම් වෙනුවෙන් බොල් ණය ප්‍රතිපාදනයෙන් අඩු කළ හැකි ප්‍රතිශතය |
|---|---|
| මාස 6 සිට මාස 36 දක්වා | 100% |
| මාස 36 සිට මාස 60 දක්වා | 75% |
| මාස 60 සිට මාස 120 දක්වා | 50% |
| මාස 120 ට වැඩි | 10% |

**(ඉ). අක්‍රිය ණය මුදලක් ලෙස වර්ගීකරණය කරන ලද ණය මුදලක් සක්‍රීය ණය මුදලක් ලෙස නැවත වර්ගීකරණය කිරීම.**

- ❖ අක්‍රිය ණය මුදලට අදාල සියළුම හිඟ හිටි මුල් මුදල සහ පොලිය ගෙවා ඇති විට නැවත සක්‍රීය ණය මුදලක් සේ සැලකේ.
- ❖ ණය මුදල ප්‍රතිලේඛණ ගත කර ඇත්නම් නොකඩවා මාස 06 ක කාලයක් වාරික ආපසු ගෙවමින් තිබීම මත එම ණය මුදල ප්‍රවර්ථන ණය මුදලක් සේ සැලකේ.

04. හඳුනා ගන්නා ලද අක්‍රීය ණය ප්‍රවර්ථන ණය ලෙජරයෙන් ඉවත් කර වෙනම ලෙජර පිටුවක සටහන් කළ යුතු අතර අක්‍රීය ණය සඳහා වෙන්කිරීම සඳහා වෙනම ගිණුම් පැන වීමක් ද සිදු කල යුතුය. මෙලෙස වෙන්කරන ලද අක්‍රීය ණය මුදලක් නැවත සක්‍රීය ණය මුදලක් බවට පත් කිරීමේ දී (ඉහත ඉ හී සඳහන් කොන්දේසි සපුරන්නේ නම් ) නැවත අක්‍රීය ණය ලෙජරයෙන් ප්‍රවර්ථන ණය ලෙජරයට මාරු කළ යුතු අතර , අක්‍රීය ණය සඳහා වෙන් කිරීම ද නැවත ගැලපිය යුතුය.

ඒ අනුව මෙම චක්‍රලේඛනයේ සඳහන් නියමයන්ට අනුව අක්‍රීය ණය වර්ගීකරණය සහ බොල්ණය සඳහා ප්‍රතිපාදනයන් සිදු කර ඒ අනුව මූලා ප්‍රකාශන පිළියෙළ කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ / කාරක සභාවේ වගකීමක් බව මෙයින් අවධාරණය කරන අතර එසේ නොකිරීමෙන් සමුපකාර සමිතිවල කටයුතු දුර්වල වන අවස්ථා වලදී ඒ සම්බන්ධව අදාළ නිලධාරීන් වගකිව යුතු බවද වැඩි දුරටත් අවධාරණය කරමි.

මෙම චක්‍රලේඛනයේ සඳහන් නියමයන් 2014.08.01 දින සිට ක්‍රියාත්මක වනු ලබන අතර මේ සම්බන්ධව මීට පෙර නිකුත් කරන ලද සියළුම චක්‍රලේඛණයන් මින් අවලංගු කරමි.

උපුල් ශාන්ත ද අල්විස්.
සමුපකාර සංවර්ධන කොමසාරිස්
සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්.

පිටපත්: 01. සියළුම මාණ්ඩලික නිලධාරීන් - දැ.පි.හා අංශගත සියළුම නිලධාරීන් දැනුවත් කිරීම සඳහා